# ACCOUNTING
# &
# IT'S NEED
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ගිණුම්කරණ යෙදවුම්

ගිණුම්කරණ නිමැවුම් වන මූල්‍ය ප්‍රකාශන බිහිකරලීමට "පදනම්" වශයෙන් භාවිත කරන දෑ ගිණුම්කරණ යෙදවුම් ය.

ඒවා ගනුදෙනු හා සිද්ධි වේ.

ගිණුම්කරණ යෙදවුම්වලට අදාළ තොරතුරු සටහන් කෙරෙන මූලාශ්‍ර ලේඛන, මුලින් ම සැලකිල්ලට ගත යුතු ය.

නිදා:

මුදල් ලැබීමේ දී - ලදුපත

මුදල් ගෙවීමේ දී - වවුචරය

## ගනුදෙනු

දෙපාර්ශ්වයක් අතර, හුවමාරුවක් සිදු වන මුදලින් මැනිය හැකි දෑ ගනුදෙනු වේ.

නිදා: විකිණීම සඳහා රුා:30,000 භාණ්ඩ තොගයක් මිල දී ගැනීම

බැංකුවෙන් රුා: 50,000 ක ණය මුදලක් ලබා ගැනීම

සේවක වැටුප් රුා: 10,000 ගෙවීම

මෙම ගනුදෙනු නිසා ව්‍යාපාරයේ වත්කම්, හිමිකම් හා වගකීම්වල මූල්‍යමය ලෙස වෙනස්වීම් සිදු වේ.

ClassWork.LK

# සිද්ධි

දෙපාර්ශ්වයක් අතර හුවමාරුවක් සිදු නොවුව ද, ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, හිමිකම් කෙරෙහි බලපෑමක් ඇති වන මුදලින් මැනිය හැකි දෑ "සිද්ධි" වේ.

උදා:

යන්ත්‍ර, ලී බඩු ආදී වත්කම් භාවිතයත් සමග ක්ෂය වීම (අගය අඩු වීම)

භාණ්ඩ තොග විනාශයට පත් වීම

ClassWork.LK

# ගිණුම්කරණ ක්‍රියාවලිය

ගිණුම්කරණ ක්‍රියාවලිය පියවර ලෙස දැක් වූ විට පහත පරිදි වේ.

1. ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන්වල වටිනාකම "මුදල්" මාධ්‍යයෙන් මැනීම.


2. මූලාශ්‍ර ලේඛන පදනම් කර ගෙන මූලික සටහන් පොත්වල වාර්තා කිරීම.

3. මූලික සටහන් පොත්වල ඇතුළත් කළ දෑ ලෙජරයට පිටපත් කිරීම.

4. ලෙජර් ගිණුම් තුලනය කර, ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීම.

5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.

ClassWork.LK




ClassWork.LK

# ගිණුම්කරණ නිමැවුම්

ගිණුම්කරණ නිමැවුම් යනු ආර්ථිකමය තීරණ ගැනීමට හැකි වන පරිදි ගිණුම්කරණ ක්‍රියාවලිය තුළින් බිහි කරන මූල්‍ය ප්‍රකාශන වේ. මීට අයත් වන්නේ,

1) කාලච්ඡේදයේ ලාභ හා අලාභ පෙන්නුම් කෙරෙන ආදායම් ප්‍රකාශනය/ලාභ හෝ අලාභ ප්‍රකාශනය.

2) නිශ්චිත දිනකට පවතින වත්කම්, වගකීම් හා හිමිකම්වල පවතින තත්ත්වය පෙන්නුම් කෙරෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

3) හිමිකමේ සිදු වන වෙනස්වීම් පෙන්නුම් කෙරෙන හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය.

4) කාලච්ඡේදය තුළ මුදල් ගලා යෑම් වෙනස්වීම් පෙන්නුම් කෙරෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශකය.

ClassWork.LK

# සාරාංශය

ගිණුම්කරණ යෙදවුම් → ගිණුම්කරණ ක්‍රියාවලිය → ගිණුම්කරණ නිමවුම්

**ගිණුම්කරණ යෙදවුම්**
- ගනුදෙනු
- සිද්ධි

**ගිණුම්කරණ ක්‍රියාවලිය**

මූලික සටහන් පොත්වල සටහන් කිරීම
↓
ලෙජරයට පිටපත් කිරීම
↓
ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

**ගිණුම්කරණ නිමවුම්**
- ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව
- හිමිකම් (ස්කන්ධය) වෙනස්වීමේ ප්‍රකාශන
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්

ClassWork.LK

## අභ්‍යාස

(1) පහත සඳහන් ගනුදෙනුවලට අදාළ තොරතුරු සටහන් වී ඇති මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

1. අත්පිට විකුණුම් රු: 25 000 කි.

2. රක්ෂණ ගාස්තු ගෙවීම් රු: 4 000 කි.

3. විකිණීම සඳහා රු: 45 000 ක තොගයක් අමල්ගේ ව්‍යාපාරයෙන් ලබා ගැනීම.

4. අමල්ගේ ව්‍යාපාරයට රු: 2 000 ක බඩු තොගයක් ඉල්ලූ වර්ගයට වඩා වෙනස්වීම මත හරවා යැවීම.

(2) ඉහත (1) හි දැක්වෙන ගනුදෙනු සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලික පොත් නම් කරන්න.

(3) ගිණුම්කරණ ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් සටහන් කරන්න.

(4) පහත සඳහන් දෑ ලබා ගැනීමට පිළියෙළ කරන මූල්‍ය ප්‍රකාශන නම් කරන්න.

(අ) කාලච්ඡේදයේ ලාභය

(ආ) වත්කම්, වගකීම් හා හිමිකම්වල තත්ත්වය

(ඇ) මූල්‍ය, තත්ත්වය වෙනස්වීම්

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura